WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

88 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)


**නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I, II**
வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும் I, II
Design and Construction Technology I, II

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) පහත දී ඇති සමාංශක රූපය බලන්න.
ඍජු ප්‍රක්ෂේපණ මූලධර්මයේ තෙවන කෝණ ක්‍රමය අනුගමනය කරමින් දී ඇති මිනුම්වලට අනුව සම්පූර්ණ පරිමාණයට පහත සඳහන් ***A***, ***B*** සහ ***C*** පෙනුම් අඳින්න.
(මිනුම් දී ඇත්තේ මිලිමීටරවලිනි)

***A*** ඊතලය දෙසින් පෙනෙන ඉදිරි පෙනුම
***B*** ඊතලය දෙසින් පෙනෙන පැති පෙනුම
***C*** ඊතලය දෙසින් පෙනෙන සැලැස්ම




(ii) ඔබ කැමති මිනුම් ගෙන විෂම පාද ත්‍රිකෝණයක් ඇඳ එහි පරිවෘත්තය නිර්මාණය කරන්න. ඔබ යොදාගත් මිනුම් ඒ ඒ පාදයට අදාළ ව සටහන් කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** දෙමහල් නිවසක බිම් මහල සකස් කර පළමු මහල සඳහා කොන්ක්‍රීට් ගෙබිම අතුරා බිම් මහලේ පේවාසිකයින් පදිංචි වී ඇත. කෙටි කාලයක දී පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව හරහා නිවස තුළට ජලය කාන්දුවන බව නිරීක්ෂණය විය.

(i) මෙවැනි පරිසරයක ඇති විය හැකි අවාසිදායක තත්ත්වයන් **දෙකක්** නම් කරන්න.

(ii) එම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා පළමු මහලේ ගෙබිම පෙදරේරුමය ක්‍රම භාවිතයෙන් නිමහම් කිරීමට සුදුසු නිමහම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iii) ඔබ ඉහත (ii) හි සඳහන් කළ **එක්** නිමහම් ක්‍රමයක් සිදු කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.


**3.** ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බැඳුම් ද්‍රව්‍යයක් ලෙස පිළිස්සූ හුනු ද භාවිත කරයි.

(i) හුනු නිෂ්පාදනය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය **තුනක්** නම් කරන්න.

(ii) හුනුගල් පිළිස්සීමේ දී සිදුවන රසායනික ප්‍රතික්‍රියාව ලියන්න.

(iii) පිළිස්සූ හුනුගල් ගබඩා කිරීමේ දී සහ ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂිත පියවර **එක** බැගින් සඳහන් කර එයට හේතුව සඳහන් කරන්න.

**4.** පහත රූපයේ දැක්වෙන්නේ ඇලුමිනියම් රාමුවක් භාවිත කර සකස් කළ දොර පියනකි.




(i) දොර පියනේ A සහ B වලින් පෙන්වා ඇති මුහුණත් දෙක සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(ii) A සහ B සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය ඇලුමිනියම් රාමුව තුළ හිරකර රඳවා ගැනීමට භාවිත කරන ද්‍රව්‍යය කුමක් ද?

(iii) දොර, ජනේල, වෙන්කිරීම් ආදී ඉදිකිරීම් ව්‍යුහ සඳහා ඇලුමිනියම් භාවිතා කිරීමේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දැවවලට සාපේක්ෂව සඳහන් කරන්න.

WWW.OLEVELAPI.COM

**5.** දැව භාණ්ඩ නිෂ්පාදනයේ දී භාවිත කරන ප්‍රධාන අමුද්‍රව්‍ය වන්නේ ශාක කඳන් ඉරාගැනීමෙන් ලබාගන්නා දැව වේ.

(i) ස්වාභාවික දැවවල ඇති ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) ඒකබීජ පත්‍ර ශාකයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) ද්විබීජ පත්‍ර ශාක කඳක හරස්කඩක් ඇඳ පහතින් දක්වා ඇති දෑ ලකුණු කරන්න.

(අ) පිට පොත්ත

(ආ) ඇතුළු පොත්ත

(ඇ) අරටුව

(ඈ) ඉරිමදය

[අනෙක් පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

6. පාසලේ ගෘහ විද්‍යාගාරය සඳහා මීටර 1 පළල, මීටර 2 ක් දිග හා මීටර 0.75 උස කෑම මේසයක් සකස් කිරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පහත දක්වා ඇත.

- මේස කකුල් සඳහා 75 mm × 75 mm හරස්කඩ සහිත දිග 750 mm දැව කැබලි 04 යි.
- රාමුව සඳහා ඝනකම 25 mm පළල 150 mm හා දිග 1 m වන ලෑලි 02 යි.
- රාමුව සඳහා ඝනකම 25 mm පළල 150 mm හා දිග 2 m වන ලෑලි 02 යි.
- මේස තට්ටුව සඳහා ඝනකම 25 mm හා පළල 200 mm වන දිග 2 m වන ලෑලි කැබලි 05 යි.
- මතුපිට ලෑල්ල සවි කිරීමට කලම්ප සඳහා ඝනකම 25 mm පළල 75 mm දිග 1 m ලෑලි කැබලි 03 යි.
- කලම්ප සවි කිරීම සඳහා 38 mm කම්බි ඇණ 200 g ක් අවශ්‍ය වේ.

75 mm × 75 mm දැව දික් මීටරයක් රු. 400.00 කි.
ඝනකම 25 mm ලෑලි ව.මී. 1 ක් රු. 500.00 කි.
මේසය සකස් කිරීම සඳහා වඩු කාර්මික කුලිය රු. 10000.00 ක් වේ.
38 mm කම්බි ඇණ 1 kg ක් = රු. 400.00 කි.

මේසය සකස් කිරීම සඳහා අවශ්‍ය මුළු වියදම ගණනය කරන්න.

7. රූපසටහන් දක්වමින් පහත සඳහන් උපකරණවලට කෙටි සටහන් ලියන්න.

(i) වානේ කෝදුව

(ii) ස්වාය මට්ටම් ලෑල්ල

(iii) කුඩුම්බි වරක්කලය

(iv) ලම්බය

(iv) මිනුම් පෙට්ටිය

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...